
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


2023 සැප්තැම්බර්
05 වෙළුම 09 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2023 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 972 දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 10.0කින් පහළ ගියේය.

2023 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,349ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.1කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)





### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)




2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම සියයට 10.1කින් පහළ ගිය අතර ආනයන වියදම සියයට 12.5කින් පහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 205ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 378ක හිඟයක් වාර්තා කළේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - සැප්.)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - සැප්.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - සැප්.)





2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, ගෝලීය ඉල්ලුම පහළ යෑමේ බලපෑමෙන් කාර්මික අපනයන පහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම පහළ ගියේය.


2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 2.2කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 12ක පහළ යෑමක් වාර්තා කළේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - සැප්.)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, ප්‍රධාන වශයෙන් තේ සහ කුළුබඩු අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම කාලපරිච්ඡේදය තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත, මුහුදු ආහාර සහ ස්වභාවික රබර් අපනයන ආදායමෙහි පහළ යෑමක් සිදුවිය.

# කාර්මික අපනයන


**කාර්මික අපනයන ආදායම**





**කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක**




**කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - සැප්.)**





**නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්**





2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය. තව ද, රබර් නිෂ්පාදිත, බනිජතෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, දැව සහ කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායමෙහි කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

**ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - සැප්.)**





**ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. - සැප්.)**





පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුන ද, අන්තර් සහ ආයෝජන ඇතුළු ආනයන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය ද, පිළිවෙළින්, සියයට 0.9 කින් සහ සියයට 11.7කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. - සැප්.)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ
ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන් සීනි, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (සහල්) ආනයන වියදම පහළ ගිය ද, සීනි සහ මේද හා තෙල් වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - සැප්.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාස වල දී බොරතෙල් ආනයනය කර නැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ තිරිඟු, පොහොර සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - සැප්.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

[Public]



# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | සැප්. 2022 | සැප්. 2023 | වෙනස (%) | ජන. - සැප් 2022 | ජන. - සැප් 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **231.2** | **242.5** | **4.9** | **1,939.8** | **1,945.4** | **0.3** |
| එයින් | තේ | 117.8 | 120.0 | 1.8 | 937.1 | 990.3 | 5.7 |
| | පොල් | 29.7 | 32.4 | 9.2 | 314.0 | 256.4 | -18.3 |
| | කුළුබඩු | 40.6 | 37.8 | -6.7 | 274.1 | 298.5 | 8.9 |
| | මුහුදු ආහාර | 17.0 | 25.7 | 51.3 | 205.3 | 193.0 | -6.0 |
| **කාර්මික අපනයන** | | **843.7** | **724.3** | **-14.2** | **8,011.5** | **6,997.9** | **-12.7** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 481.5 | 363.0 | -24.6 | 4,577.2 | 3,688.7 | -19.4 |
| | රබර් නිෂ්පාදිත | 78.9 | 80.6 | 2.2 | 755.1 | 668.6 | -11.5 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 30.0 | 45.7 | 52.3 | 439.9 | 371.4 | -15.6 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 39.8 | 43.2 | 8.6 | 405.8 | 397.7 | -2.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 52.0 | 46.9 | -9.9 | 427.9 | 465.5 | 8.8 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 47.9 | 41.3 | -13.9 | 336.5 | 394.3 | 17.1 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.4 | 7.3 | -21.9 | 63.6 | 55.1 | -13.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.9** | **4.9** | **1.3** | **40.7** | **38.5** | **-5.5** |
| **මුළු අපනයන** | | **1,079.8** | **971.7** | **-10.0** | **9,992.0** | **8,981.8** | **-10.1** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | සැප්. 2022 | සැප්. 2023 | වෙනස (%) | ජන. - සැප් 2022 | ජන. - සැප් 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **201.1** | **214.2** | **6.5** | **2,146.7** | **2,242.5** | **4.5** |
| **ආහාර හා පාන වර්ග** | | 121.5 | 108.6 | -10.7 | 1,227.7 | 1,266.6 | 3.2 |
| එයින් | එළවළු (ආ) | 23.5 | 23.9 | 1.7 | 249.7 | 271.3 | 8.6 |
| | සහල් | 24.9 | 1.0 | -95.9 | 254.5 | 14.2 | -94.4 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 79.6 | 105.7 | 32.8 | 919.0 | 976.0 | 6.2 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.5 | 45.2 | 1.5 | 392.0 | 511.4 | 30.5 |
| **අන්තර් භාණ්ඩ** | | **913.4** | **919.9** | **0.7** | **9,497.4** | **8,105.4** | **-14.7** |
| එයින් | ඉන්ධන | 376.4 | 396.7 | 5.4 | 3,694.3 | 3,476.3 | -5.9 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 231.5 | 176.6 | -23.7 | 2,407.2 | 1,760.6 | -26.9 |
| | පොහොර | 6.3 | 22.0 | 249.7 | 104.5 | 161.8 | 54.8 |
| | තිරිඟු හා ඉරිඟු | 18.2 | 62.2 | 240.6 | 188.5 | 264.0 | 40.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **169.9** | **215.3** | **26.7** | **2,441.1** | **1,975.6** | **-19.1** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 108.3 | 136.7 | 26.2 | 1,570.7 | 1,355.7 | -13.7 |
| **මුළු ආනයන** | | **1,284.4** | **1,349.4** | **5.1** | **14,085.2** | **12,323.5** | **-12.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | සැප්. 2022 | සැප්. 2023 | වෙනස (%) | ජන. - සැප් 2022 | ජන. - සැප් 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -204.5 | -377.6 | | -4,093.3 | -3,341.6 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | සැප්. 2022 | සැප්. 2023 | වෙනස (%) | ජන. - සැප් 2022 | ජන. - සැප් 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 150.3 | 135.2 | -10.0 | 154.5 | 138.9 | -10.1 |
| | පරිමා දර්ශකය | 146.2 | 161.9 | 10.7 | 163.3 | 166.8 | 2.2 |
| | මිල දර්ශකය | 102.8 | 83.5 | -18.7 | 94.6 | 83.3 | -12.0 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 114.9 | 120.8 | 5.1 | 140.1 | 122.5 | -12.5 |
| | පරිමා දර්ශකය | 102.7 | 126.0 | 22.7 | 128.3 | 127.1 | -0.9 |
| | මිල දර්ශකය | 111.9 | 95.8 | -14.4 | 109.2 | 96.4 | -11.7 |
| **වෙළඳ මිල අනුපාතය** | | 91.9 | 87.2 | -5.1 | 86.7 | 86.4 | -0.4 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද